අයවැය කැඳවීම - 2006
ජාතික අයවැය චක්‍රලේඛ අංක 123
දිනය:- 2005.07.15

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

# 2006 අයවැය ලේඛනය සකස්කිරීම සඳහා මාර්ගෝපදේශ හා මග පෙන්වීම්

අන්තර්ගතය


01. හැඳින්වීම

02. ප්‍රතිපත්ති ප්‍රමුඛතාව සහ සැලකිල්ලට ගත යුතු කරුණු
- 02.1 දිළිඳු හිතවාදී ආර්ථික වර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය
- 02.2 මානව සම්පත් සංවර්ධනය
- 02.3 යටිතල පහසුකම් සංවර්ධනය
- 02.4 නිෂ්පාදන හා සේවා
- 02.5 විද්‍යාව, තාක්ෂණය හා පර්යේෂණ සංවර්ධනය
- 02.6 සමාජ ආරක්ෂණය
- 02.7 කලාව, සංස්කෘතිය හා ආගම
- 02.8 රාජ්‍ය පාලනය
- 02.9 මහජන සාමය හා ආරක්ෂාව
- 02.10 සංවර්ධන ප්‍රතිපත්ති මූලාරම්භයන්
- 02.11 මැදිකාලීන වියදම් රාමුව-2006 - 2008
  - 02.11.1.1 මැදිකාලීන පුරෝකතනයන්
  - 02.11.1.2 මැදිකාලීන කාර්යසාධන දර්ශක
  - 02.11.1.3 ප්‍රාදේශීය පදනම මත සම්පත් බෙදා හැරීම
- 02.12 අංශයීය වියදම් සීමා
  - 02.12.1.1 පුනරාවර්තන වියදම් සීමා
  - 02.12.1.2 ප්‍රාග්ධන වියදම් සීමා

03. අයවැය සැකසීම සඳහා මාර්ගෝපදේශ
- 03.1 ඇස්තමේන්තු සකස් කිරීම.
  - 03.1.1 පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු
  - 03.1.2 ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු
- 03.2 පරිපූරක ප්‍රතිපාදන - 2006
- 03.3 වෙනත් තොරතුරු
  - 03.3.1.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වාහන පිළිබඳ තොරතුරු
- 03.4 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම
  - 03.4.1.1 වැඩසටහන් හා වැය විෂයන්
  - 03.4.1.2 උප ව්‍යාපෘති
  - 03.4.1.3 ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනවලට අදාල ඇස්තමේන්තු
- 03.5 ඇස්තමේන්තු වාර්තා ඉදිරිපත් කිරීම

04. ඇමුණුම්
- 04.1 පැහැදිලි කර ගැනීම්
- 04.2 ඇස්තමේන්තු කෙටුම්පත් භාරදීම සඳහා අවසන් දිනය
- 04.3 අපේක්ෂිත අයවැය දින දර්ශණය


අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍ර

- දැනුම මත පදනම් වූ කුසලතා පූර්ණ සෞඛ්‍ය සම්පන්න හා වඩාත් ඵලදායි මානව සම්පත් ගොඩනැගීම සඳහා පුද්ගලයින් විෂයෙහි වූ ආයෝජන කිරීම.
- සම්පත්, වෙළඳපල සහ සේවා නියුක්තිය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කිරීම තුළින් නවීන ගුණාත්මක සහ කාර්යක්ෂම ග්‍රාමීය හා නාගරික යටිතල පහසුකම් ජාලයක් තුළින් ජාතිය ගොඩනැංවීම.
- දිවයිනේ සෑම ප්‍රදේශයකටම තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම.
- වැඩි අස්වනු ලබාදෙන බීජ ප්‍රභේදයන් හඳුන්වාදීම, වැඩිදියුණු කරන ලද ජල කළමනාකරණය, භාවිතයට නොගත් ඉඩම් නොමැති අය අතර බෙදාදීම. නවීන තාක්ෂණය හඳුන්වාදීම, එකතු කළ අගය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණය, වෙළඳ සන්නම් ප්‍රවර්ධනය සහ ප්‍රතිරූප ගොඩනැංවීම තුළින් ඵලදායිතාව නැංවීම කේන්ද්‍රකර ගනිමින් කෘෂිකර්මය නවීකරණය කිරීම.
- උසස් තාක්ෂණය භාවිතා කිරීම තුළින් ප්‍රාථමික හා තොනිමි නිෂ්පාදන මත පදනම් වූ කර්මාන්ත ඉහළ එකතු කළ වටිනාකමින් හා දේශීය සම්පත් මත පදනම් වූවක් බවට පත් කිරීමට උනන්දු කිරීම.
- දේශීය පදනමක් සහිත අමු ද්‍රව්‍ය භාවිතය තුළින් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හා මැනවින් විවිධාංගීකරණය වූ අපනයන ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම.
- සංචාරක කර්මාන්තය ප්‍රධාන වර්ධන හවුල්කරුවෙකු බවට පත්කිරීම සඳහා පරිසර ආශ්‍රිත සංචාරක කටයුතු සහ ඉහළ පෙළේ ගණුදෙනුකරුවන් කේන්ද්‍රකොටගත් නව ආරම්භයන් දිරිමත් කිරීම.
- දිළිඳුකම අඩු කිරීම ඉලක්ක කරගත් ප්‍රධාන ව්‍යාපෘති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය දිළිඳුභාවය පිටුදැකීම. උදා: ගැමිදිරිය,මග නැගුම, දහසක් වැව්, ගමට තාක්ෂණය සහ කිරිගම්මාන යනාදිය වේ.
- සහස්‍ර සංවර්ධන අරමුණුවලට අදාල නව සංවර්ධන උපාය මාර්ග, විශේෂයෙන්ම දිළිඳුකම පිටුදැකීම, රජයේ මධ්‍ය කාලීන අයවැය රාමුවට සම්බන්ධ කිරීම.

| | |
|---|---|
| | ▪ පොදු මහජනතාව සඳහා ආරක්ෂිත, විශ්වාසනීය, නියමිත කාලසටහනට අනුව ක්‍රියාත්මක වන කාර්යක්ෂම පොදු බස් සහ දුම්රිය ගමනා ගමන සේවාවක් සැපයීම.<br><br>▪ සමාජයේ පිළිගැනීමක් ඇතිව ජීවත් වීමට හැකිවන සේ සියලුම නිවාස නොමැති පවුල් සඳහා ස්වකීය නිවසක් ලබාදීම. එක් එක් සමාජ කාණ්ඩයේ වියදම් දැරීමේ හැකියාව මත පදනම් කොට ගෙන පහසුකම් සැපයීමේ ක්‍රමය විවිධාකාර වේ.<br>උදා: ස්වශක්තිය මත පදනම් වූ ආරම්භනයන්, සහනදායී ණය, වැඩිදියුණු කරන ලද ඉඩම්, සේවා සැපයීම, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාර තත්ත්වයන්, සහ බදු සහන දැක්විය හැක.<br><br>▪ ජාතික උරුමයන්ගෙන් පෝෂිත වූ සියලු ජන කොටස්වල, සංස්කෘතික සම්ප්‍රදායන් සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ව්‍යාප්තිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br><br>▪ මූලික යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා යළි ගොඩනැංවීම සහ ජීවිකාව ගෙන යාමට සහාය වන වැඩසටහන් හඳුන්වාදීම මගින් උතුරු නැගෙනහිර ජනවාර්ගික ගැටුම්වලට ගොදුරු වූ ප්‍රදේශ යළි ගොඩනැංවීම.<br><br>▪ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් වර්ධනය, මූලික පහසුකම් සැපයීම සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් තේ හා රබර් කර්මාන්තයේ සේවය කරන ජනගහනයෙන් වැඩි කොටසක් අයත් වතු අංශයේ ජනතාවගේ සමාජ-ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම<br><br>▪ පීඩාවට පහසුවෙන් ගොදුරුවන දිළිඳු ජන කොටස් වලට ඵලදායි ආර්ථික කටයුතුවල නියැලීමට පහසුකම් සැපයීම සහ ආබාධිත හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සේවාවන් සඳහා ප්‍රවේශය හා ඒවායේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.<br><br>▪ සුනාමියෙන් විපතට පත් ප්‍රදේශ යළි ගොඩනැංවීම හා ප්‍රතිසංස්කරණය සඳහා සහ එම ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ ජීවිකා වෘත්තීන් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම. |

# වියදම් ඇස්තමේන්තු සැකසීම

## 2006 අයවැය සහ 2006 - 2008 මැදි කාලීන අයවැය රාමුව

### 1 වන කොටස - හැඳින්වීම

### 1 පදනම හා ක්‍රමෝපාය

1.1 "පැහැබර හෙටක් - පළබර දැයක්` යන මැයෙන් එළි දැක් වූ රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි අන්තර්ගත සමස්ත ප්‍රතිපත්ති දර්ශනය ඇතුළත සකසන ලද 2005 - 2007 මැදි කාලීන අයවැය රාමුව පදනම් කර ගනිමින් 2005 වසරේ ජාතික අයවැය සකස් කරන ලදී. මෙම අයවැය රාමුවට අනුකූලව, මැදි කාලීන සන්දර්භයක් තුළ, ආර්ථික වර්ධනය හා දිළිඳුකම අඩු කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රමෝපායයන් පිළිබඳව තවදුරටත් සාකච්ඡා හා උපදේශනයන් ප්‍රවර්ධනය කිරීම පිණිස " ආර්ථික වර්ධනය හා දිළිඳුකම අඩු කිරීම සඳහා වන නව සංවර්ධන ක්‍රමෝපාය රාමුව," 2005 සංවර්ධන සංසදයේදී ඉදිරිපත් කෙරුණි.

1.2 2006 වසර අයවැය සඳහා ක්‍රමෝපාය වනුයේ දිළිඳු හිතවාදී ක්‍රමෝපායන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින්, 2005 අයවැයේදී ප්‍රකාශයට පත් කරන ලද පුළුල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමයි. එමගින්, ජීවන තත්වයෙහි ගුණාත්මක භාවය නංවාලනු පිණිස, දරිද්‍රතාව හා සේවා වියුක්තිය යන කඩිනමින් විසඳිය යුතු සමාජ ගැටලුවලට පිළියම් ලබාදීමට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත. තවද, (අ) ළමුන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (ආ) යුද්ධයෙන් හානියට පත් දිස්ත්‍රික්ක පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය (ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය (ඈ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ (ඉ) සහස්‍ර සංවර්ධන ඉලක්ක, එමගින් නිශ්චිතව හඳුනාගෙන ඇත. වාර්ෂික ආර්ථික වර්ධනය සියයට 6-8 අතර පවත්වා ගැනීම සඳහා මහා මාර්ග, විදුලිබල, ප්‍රවාහන, වරාය හා සන්නිවේදනය වැනි නවීන යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහිද අවධානය යොමු කර තිබේ. ඇමුණුම 1මගින් දැක්වෙන පරිදි රජය විසින් සහස්‍ර සංවර්ධන ඉලක්ක සහ ඊට අදාළ ක්‍රමෝපායයන් විධිමත් අයුරින් දියත් කොට ඇත. සියලුම රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් වැය දරණ ආයතන විසින් ඉහත සඳහන් ප්‍රතිපත්ති රාමුව අනුව ස්වකීය කාර්යභාරය හා වගකීම් හඳුනාගත යුතුවේ. ආර්ථික වර්ධනය වේගවත් කිරීම, දිළිඳුකම අඩුකරලීම හා ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම, සහ සහස්‍ර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම පිණිස මෙම චක්‍රලේඛයේ 2 වන කොටසෙහි දක්වා ඇති අංශ නවය සඳහා 2006 වසර අයවැය ප්‍රතිපාදන සහ 2006-2008 මැදි කාලීන අයවැය ප්‍රතිපාදන වෙන් කළ යුතුවේ. පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ ගැටළු පිළිබඳව සලකා බැලීමේදී අවධානය යොමු කෙරෙන සාර්ව ආර්ථික රාමුව ඇමුණුම II හි දක්වා ඇත.

1.3 සමස්ත අය වැය ක්‍රියාවලියේදී, පහත දැක්වෙන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) මාර්ග ජාලය සංවර්ධනය කිරීම තුළින් මාර්ගවලට ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීම.

(ආ) වෙළඳ පොළ සමඟ ඇඩි සබඳතාවක් ඇති කිරීම.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා සූක්ෂම ණය පහසුකම් ප්‍රවර්ධනය.

(ඈ) කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, සහ

(ඉ) ශ්‍රම බලකායේ, විශේෂයෙන්ම තරුණ කොටස් අතර, (තරුණ විරුකියාව 21% පමණ වේ) වෙළඳපොළ ඉල්ලුමට අනුකූලව නිපුණතා සංවර්ධනය.

සහස්‍ර සංවර්ධන අරමුණුවල පළමු ඉලක්කය වන, දරිද්‍රතා රේඛාවට වඩා පහළ ආදායමක් ලබන පුද්ගලයින් සංඛ්‍යාව අඩු කිරීම කෙරෙහි මැදි කාලීන අයවැය රාමුව තුළින් ඉහලම ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. මෙම තත්ත්වය යටතේ අඩු වේගයකින් පහත බසින මර්තතාවය, කාන්තාවන් හා ළමුන් අතර පවතින ඉහළ මට්ටමේ ඌණ පෝෂණය, ළමුන් අතර පවතින මන්ද පෝෂණය සහ කාන්තාවන් සඳහා තොරතුරු තාක්ෂණ නිපුණතා හා වෘත්තීය කාර්මික අධ්‍යාපන අවස්ථා හිඟයන් යන කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

1.4 අදාල අමාත්‍යාංශ සහ ඒවායේ විශේෂිත කාර්යභාරයන් අංශයීය වර්ගීකරණය තුල හඳුනා ගෙන තිබේ. මෙම චක්‍රලේඛනයේ 02 වන කොටසෙහි දැක්වෙන එක් එක් අංශයීය ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් යටතේ ඒවා ලැයිස්තුගත කොට තිබේ. <u>එකම කාර්යයන් හා ක්‍රියාකාරකම් විවිධ ආයතන මඟින් සිදු නොවන ආකාරයට වග බලා ගත යුතු බවට සියළුම ලේකම්වරුන්ගෙන් හා ආයතන ප්‍රධානීන්ගෙන් තරයේ ඉල්ලා සිටිනු ලබන අතර,</u> නාස්තිය අවම කිරීම හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස ඔවුනොවුන් අතර, ස්වකීය කාර්යයන් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුවේ. පළාත් සභාවලට පවරා දෙනු ලැබූ කාර්යයන් සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය අදාල කරගත යුතුය. එවිට පළාත් ක්‍රියාකාරකම් සඳහා වෙන් කළයුතු සම්පත්, මධ්‍යම රජයේ අමාත්‍යාංශ මඟින් ඉල්ලා සිටීම වැළකෙනු ඇත. <u>මැදිකාලීනව අවශ්‍ය අරමුදල් හඳුනා ගැනීමේදී සියලුම ලේකම්වරුන් පහත සඳහන් මාර්ගෝපදේශ මූලධර්මවලට අනුකූලව ක්‍රියාකිරීම, අපේක්ෂා කෙරේ. ස්වකීය අමාත්‍යාංශවලට අදාළ අයවැය සැකසීමේදී අමාත්‍යාංශ ලේකම්වරුන් පෞද්ගලිකවම ඊට සම්බන්ධවීම සහ අධීක්ෂණය කිරීම සිදු කළ යුතුවේ.</u>

## 2 කොටස - මාර්ගෝපදේශක මූලධර්ම

## 2.0 ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ සැලකිල්ලට ගත යුතු කරුණු

### 2.1 දිළිඳු හිතවාදී ආර්ථික වර්ධනය සහ ප්‍රාදේශීය සංවර්ධනය

2.1.1 ප්‍රාදේශීය හා ප්‍රජා මට්ටමේ යටිතල පහසුකම් නඟා සිටුවමින් රැකියා උත්පාදනය හා ආදායම් ඉඩ ප්‍රස්ථා ඇති කර අඩු ආදායම්ලාභී සහ පීඩිත ජන කොටස්වල ජීවන තත්වය නංවාලීම හා එමඟින් ප්‍රාදේශීය මට්ටමේ පවත්නා ආදායම් විෂමතාවය අවම කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම සංවර්ධන ක්‍රියාවලියේදී දිළිඳු ජනතාව මනාව සංවිධානය කොට සංවර්ධන කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීමත්, ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයත් දිරිමත් කෙරේ.

2.1.2 මෙතෙක් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති හා උපාය මාර්ග තුළින්, අදායම, යටිතල පහසුකම්, මහජන උපයෝගිතාවන් යනාදියෙහි ප්‍රාදේශීය මට්ටමින් පවත්නා අසමානතා අඩු කිරීමේලා අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව මුළු ජනගහනයෙන් 23% ක් දරිද්‍රතා රේඛාවට වඩා පහළ මට්ටමක ජීවත් වේ. මාතලේ, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක 12 තුළ ජීවත්වන ජනගහණයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක දරිද්‍රතාවය, ජාතික මට්ටමේ සාමාන්‍ය දරිද්‍රතා අනුපාතයට වඩා ඉහළ මට්ටමක ඇත. උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා සංඛ්‍යාලේඛන නොමැති වුවත්

දිළිඳුකම මනින දර්ශක එලෙසම අසතුටුදායකය. එබැවින් ව්‍යාපෘති හා වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉහත කී දිස්ත්‍රික්කවල ජනතාවගේ සමාජ ආර්ථික තත්වයන් නගා සිටුවීම සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙස සියළුම ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

2.1.3 උතුරු නැගෙනහිර යුද්ධයෙන් හානියට පත් වූ ප්‍රදේශ පුනරුත්ථාපනය හා නැවත ගොඩනැංවීමේදී, එම ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය, නැවත පදිංචි කරවීම වේගවත් කිරීම සහ ජීවන වෘත්තීන්ට සහාය වන වැඩ සටහන් ඇති කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. යුද්ධයෙන් පීඩිත ජනතාවගේ මූලික අවශ්‍යතා සැපයීම හා ප්‍රතිසන්ධාන වැඩ සටහන් ප්‍රවර්ධනය සඳහා ඉහළම ප්‍රමුඛත්වයක් වියදම් වැඩ සටහන් සකස් කිරීමේදී ලබාදිය යුතුය.

2.1.4 තේ හා රබර් වැවිලි අංශයෙහි වැඩි වශයෙන් සේවයේ නියුක්ත ජනගහණයකින් සමන්විත වතු අංශයේ සමාජ – ආර්ථික තත්වය වැඩි දියුණු කිරීම අරමුණු කොටගත් වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී විශේෂ සැලකිල්ලක් යොමු කෙරේ. වතු අංශයේ දිළිඳුභාවයේ අනුපාතය 30% ක් පමණ වන අතර, එය ජාතික මට්ටමේ සාමාන්‍ය අනුපාතයට වඩා ඉහළ අගයකි. එම තත්ත්වය අවම කර ගැනීමට වතු ජනතාවගේ සෞඛ්‍ය, අධ්‍යාපන, නිවාස, විදුලිබල, ජලය සහ සනීපාරක්ෂක පහසුකම්වල තත්වය වැඩි දියුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කල යුතුවේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගත් දිළිඳුකම අවම කිරීමේ විශේෂිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම උනන්දු කරනු ලැබේ.

2.1.5 සුනාමි ව්‍යවසනයට භාජනය වූ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන වෘත්තීන් යළි ගොඩනැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් පශ්චාත් සුනාමි ප්‍රතිසංවිධාන හා නැවත ගොඩනැඟීමේ උපාය මාර්ගයද 2006 අයවැය තුළ අන්තර්ගත වනු ඇත.

2.1.6 සියළුම අමාත්‍යාංශ විසින්, දිළිඳුකම පිටුදැකීම සහ එකතු කළ අගය සම්බන්ධයෙන් සාධාරණීකරණය කළ නොහැකි කාලයක් තිස්සේ පවත්වා ගෙන ගිය වැඩ සටහන් වෙතොත් ඒවා ක්‍රමාණුකූලව ඉවත් කිරීම හෝ සම්පූර්ණයෙන් අතහැර දැමීම කළ යුතුවේ.

රාජ්‍ය ආයතන විසින් තිරසාර පදනම මත පිහිටා දරිද්‍රතාවය අවම කිරීම සඳහා යොමු වූ නව නිර්මාණාත්මක වැඩ සටහන් යෝජනා කළ යුතුවේ. අංශයීය වැය සීමාවන් හා රජයේ සංවර්ධන ප්‍රමුඛතා සැලකිල්ලට ගෙන තම සංවර්ධන වැඩ සටහන්ද ප්‍රමුඛතා පදනම මත පෙළ ගැස්වීමට අමාත්‍යාංශ නම්‍යශීලී විය යුතුය.

වගුව 1

| අමාත්‍යාංශය | විශේෂිත මූලාරම්භයන් |
|---|---|
| සමෘද්ධි සහ දිළිඳුකම පිටු දැකීමේ | ජන පුබුදුව, ගැමි දිරිය, ගැමි පුබුදුව |
| පළාත් සභා හා පළාත් පාලන | පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන් සහ ප්‍රාදේශීය සංවර්ධන මූලාරම්භයන් |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන | විමධ්‍යගත අයවැය වැඩසටහන |
| කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන | කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩ සටහන |
| පුනරුත්ථාපන හා දිස්ත්‍රික්ක සංවර්ධන (වන්නි) | ප්‍රදේශයට විශේෂිත වූ ව්‍යාපෘති |
| පුනරුත්ථාපන හා දිස්ත්‍රික්ක සංවර්ධන(මඩකලපුව) | ප්‍රදේශයට විශේෂිත වූ ව්‍යාපෘති |
| පුනරුත්ථාපන හා දිස්ත්‍රික්ක සංවර්ධන(ත්‍රිකුණාමලය) | ප්‍රදේශයට විශේෂිත වූ ව්‍යාපෘති |
| නැගෙනහිර පළාතේ යටිතල පහසුකම් සංවර්ධන | ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන වැඩ සටහන් |
| වතු නිවාස යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය | වතු අංශය තුළ සෞඛ්‍ය, අධ්‍යාපන, ජල සම්පාදනය, මාර්ග, නිවාස සහ විදුලිය වැනි සමාජ ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම |
| සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසන්ධාන | යුද්ධයෙන් විනාශ වූ ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය - ප්‍රදේශයට විශේෂිත වූ ව්‍යාපෘති |
| තැපැල් හා විදුලි සංදේශ සහ උඩරට සංවර්ධන | උඩරට ගැමි සංවර්ධන ව්‍යාපෘති, උඩරට සංවර්ධන ආරම්භයන් |
| කුඩා හා ග්‍රාමීය කර්මාන්ත | දහසක් කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩ සටහන |
| මහා මාර්ග | මග නැගුම |
| කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග | දහසක් මහ වැව්, කිරි ගම්මාන, සුළු වාරිමාර්ග ව්‍යාපෘති |
| සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන | පුබුදමු වෙල්ලස්ස |
| මහවැලි හා ගංගාධාර සංවර්ධන හා රජරට සංවර්ධන | රජරට නවෝදය |
| දේශීය වෛද්‍ය | ඖසු ගම්මාන ව්‍යාපෘති |
| නිවාස සහ ඉදිකිරීම් කර්මාන්ත. නැගෙනහිර පළාත් අධ්‍යාපන හා වාරිමාර්ග සංවර්ධන | ග්‍රාමීය නිවාස වැඩ සටහන, දැයට සෙවන |
| නාගරික සංවර්ධන හා ජල සම්පාදන | ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති |
| විදුලිබල හා බල ශක්ති | ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති |
| මධ්‍ය හා කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත සහ ග්‍රාමීය මානව සම්පත් සංවර්ධන | ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය- නුවරඑළිය |
| සංචාරක | ප්‍රජා සංචාරක කටයුතු |
| මුදල් හා ක්‍රම සම්පාදන | සූක්ෂම මූල්‍ය පහසුකම් |
| සුනාමි සම්බන්ධ අමාත්‍යාංශ සංවර්ධන වැඩ සටහන් | ජීවන වෘත්තීන් සඳහා සහායවීම, නිවාස සහ රුකවරණ |

## 2.2 මානව සම්පත් සංවර්ධනය

2.2.1 අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය වියදම් ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන ප්‍රවේශ අවස්ථාවන් වැඩි කිරීමටත්, අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමටත්, යොමු කිරීම අව ශ්‍යය. ගෝලීය සහ දේශීය වෙළඳ පල තුළින් ඇති වන ඉල්ලුමට සරිලන රැකියා ඉලක්ක කොටගත් නව උපාධි පාඨමාලා හඳුන්වා දිය යුතු අතර, දැනටමත් ආරම්භ කර ඇති ඉල්ලුම පදනම් කොට ගත් උපාධි පාඨමාලා තවදුරටත් පුළුල් කිරීම කෙරෙහිද උසස් අධ්‍යාපනයෙහි අවධානය යොමු විය යුතුය. ගෝලීය තරඟකාරීත්වය හමුවේ වේගයෙන්

වෙනස්වන තාක්ෂණික සංවර්ධනයට තරගකාරීව මුහුණදීමට සමත් වැඩි ඵලදායී සහ බහුවිධ කුසලතාවයන්ගෙන් හෙබි ශ්‍රම බලකායක් ඇති කිරීම කෙරෙහි, කාර්මික අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන්, මධ්‍ය කාලීනව ( 2006-2008) ඉලක්ක කර ගත යුතුය.

2.2.2 අඩු ආදායම්ලාභී අවදානමට ලක්වන කණ්ඩායම් වෙත වැඩි අවධානයක් යොමු කරමින්, ගුණාත්මක බවින් යුත් නවීන සෞඛ්‍ය සේවා පහසුකම් සමාන ලෙස සැමටම ලබාදීම 2006-2008 සෞඛ්‍ය අංශයේ මධ්‍යකාලීන ආයෝජන වැඩ සටහනෙහි ප්‍රධාන අරමුණ වේ. වර්තමානයේ රෝග ප්‍රතිකාරක සේවා වෙත ලබාදී ඇති අවධානය රෝග නිවාරණ සේවා කෙරෙහි යොමු කළ යුතුව ඇත. මෙය රෝග නිවාරණ වැඩ සටහන්වල ආයෝජනය ඉහළ නැංවීම මගින් කළ යුතු අතර, එමගින් බෝවන සහ බෝනොවන රෝග අවම කළ හැකිවේ. ඒ සඳහා මේ සමගම කාර්යක්ෂම පිරිවැයකින් යුතු පෝෂණ වැඩ සටහන් ද ක්‍රියාත්මක කළ යුතුය. ඒ හා සමාන අවධානයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පවතින මානව සම්පත් හිඟය අඩු කිරීම කෙරෙහිද යොමු කළ යුතුය.

2.2.3 මේ අතර, ආයුර්වේද අංශයේ ආයෝජන, දේශීය සහ විදේශීය වශයෙන් ආයුර්වේද ඖෂධවලට ඇති ඉල්ලුම සපුරාලීමට සඳහා එම ඖෂධ නිෂ්පාදනය දේශීයව නංවාලීමටත්, එම අංශයේ පර්යේෂණ කටයුතු දිරිමත් කිරීම සඳහාත්, යෙදවිය යුතුය. ඒ සමඟම රෝග නිවාරණ පිළිබඳ වැඩ සටහන් දියත් කිරීම සඳහා, පළාත් පාලන ආයතන, කාර්යය සාධන බලකායන් සහ ඒ සඳහා උනන්දුවක් දක්වන වෙනත් ආයතන, දිරිමත් කිරීමේ පදනමින් සකස් කළ ව්‍යාපෘතීන් හඳුනා ගත යුතුය.

වගුව II

| අමාත්‍යාංශය | සංවර්ධන මූලයන් |
|---|---|
| සෞඛ්‍ය | |
| සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධනය<br><br>දේශීය වෛද්‍ය | රෝග නිවාරණ වැඩසටහන් වැඩි දියුණු කිරීම, රෝහල් සංවර්ධනය කිරීම, උපකාරක සේවා වැඩි දියුණු කිරීම සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම.<br>දේශීය වෛද්‍ය සේවය නංවාලීම, ඖසු වගාව |
| අධ්‍යාපනය | |
| අධ්‍යාපන | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය පිහිටුවීම සහ පවතින විශ්ව විද්‍යාල වැඩි දියුණු කිරීම. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ප්‍රවේශ අවස්ථා හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, ගුරු අධ්‍යාපනය හා පුහුණුවීම් වැඩි දියුණු කිරීම, තොරතුරු තාක්ෂණය පන්ති කාමර තුලට හඳුන්වාදීම, පංති කාමර නවීකරණය කිරීම. |
| නිවාස සහ ඉදිකිරීම් කර්මාන්ත, නැගෙනහිර පළාත් අධ්‍යාපන හා වාරිමාර්ග සංවර්ධන | නැගෙනහිර පළාත් අධ්‍යාපනය නගා සිටුවීම. |
| නිපුණතා සංවර්ධනය | |
| නිපුණතා සංවර්ධන, වෘත්තීය සහ කාර්මික අධ්‍යාපන | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයක් පිහිටුවීම පසු බිම්කරගත් මූලික වැඩ කටයුතු ඇරඹීම, වෘත්තීය පුහුණු වැඩ සටහන් සඳහා ප්‍රවේශ අවස්ථාවන් වැඩි කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන්වල ගුණාත්මක බව හා අදාලත්වය වැඩිදියුණු කිරීම |
| කෘෂිකාර්මික, අලෙවි සංවර්ධන, සමුපකාර, සංවර්ධන, හින්දු ආගමික කටයුතු සහ සහායක අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු | උතුරු නැගෙනහිර අවතැන්වූවන් සඳහා විශේෂිත වෘත්තීය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම |
| මධ්‍ය හා කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත සහ ග්‍රාමීය මානව සම්පත් සංවර්ධන | ජාතික යොවුන් බලකාය ක්‍රියාත්මක කිරීම |
| කම්කරු හා කම්කරු සබඳතා | |
| කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති | කම්කරු නීති ක්‍රියාත්මක කිරීම සහ කර්මාන්ත, කම්කරු සබඳතා ඉහළ නැංවීම. |
| ක්‍රීඩා හා යෞවන කටයුතු | ක්‍රීඩා හා තරුණ කටයුතු සංවර්ධනය කිරීම. |

## 2.3 යටිතල පහසුකම් සංවර්ධනය

2.3.1 රටේ සම්පත් - වෙළඳපොල හා රැකියා අවස්ථා අතර තිබිය යුතු සහසම්බන්ධතාවය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය රටපුරා ව්‍යාප්ත වූ කාර්යක්ෂම, නවීන හා උසස් තත්ත්වයෙන් යුත් යටිතල පහසුකම් පද්ධතියක් නිර්මාණය කළ යුතුව ඇත. දේශයේ තරඟකාරිත්වය වර්ධනය කිරීම මෙයින් අපේක්ෂිත මූලික අරමුණයි. එමනිසා විදුලිබලය, ප්‍රවාහන, මාර්ග, නාගරික පහසුකම්, වරාය හා ගුවන් තොටුපළ වැනි සේවාවන්වල ධාරිතාවේ හා ගුණාත්මක භාවයේ සීඝ්‍ර වර්ධනයක් සහ ඒ තුලින් ජනතාවට මෙකී සේවාවන් පහසුවෙන් ලබා ගැනීමට ඉඩකඩ සැලසීම මඟින් පවතින ප්‍රාදේශීය ඇඩි අසමානතා තුලනය කිරීම සහතික වනු ඇත.

වගුව III

| අමාත්‍යාංශය | ප්‍රධාන ව්‍යාපෘති |
|---|---|
| තැපැල්, විදුලි සංදේශ හා උඩරට සංවර්ධන | විදුලි සංදේශ ජාලය ව්‍යාප්ත කිරීම, තැපැල් ජාලය නවීකරණය, |
| වරාය හා නාවික | කොළඹ, කන්කසන්තුරේ, පේදුරුතුඩුව, ගාල්ල, හම්බන්තොට, ඔලුවිල් වරායන් දියුණු කිරීම හා සංවර්ධනය<br>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල නවීකරණය |
| නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත, නැගෙනහිර පළාත් අධ්‍යාපන හා වාරිමාර්ග සංවර්ධන | "දැයට සෙවන" ජාතික නිවාස සංවර්ධන වැඩ සටහන (වාණිජ නිවාස), ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතා වැඩි දියුණු කිරීම හා දේශීය කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම. |
| නාගරික සංවර්ධන හා ජලසම්පාදන | නාගරික පහසුකම් සංවර්ධනය, ජල සැපයුම් පද්ධතිය පුනරුත්ථාපනය හා තවදුරටත් ව්‍යාප්ත කිරීම සහ සනීපාරක්ෂක පද්ධති ඇති කිරීම. |
| ප්‍රවාහන | ප්‍රවාහන සේවා නවීකරණය හා වැඩිදියුණු කිරීම. |
| විදුලිබල හා බල ශක්ති | විදුලිබල උත්පාදනය වර්ධනය කිරීම, සම්ප්‍රේෂණය හා බෙදා හැරීම ව්‍යාප්ත කිරීම. |
| මහා මාර්ග | දකුණු හා කොළඹ- කටුනායක අධිවේගී මාර්ග, පිට වටරවුම් මාර්ග, උතුරු - නැගෙනහිර, මධ්‍යම, සබරගමු, දකුණු හා බස්නාහිර පළාත් මාර්ග ජාලය වැඩි දියුණු කිරීම. රත්නපුර, බලංගොඩ හා බණ්ඩාරවෙල මාර්ග පුනරුත්ථාපනය. කින්නියා හා මනම්පිටිය පාලම් ප්‍රතිසංස්කරණය කිරීම. |

## 2.4 නිෂ්පාදන සහ සේවා

2.4.1 තිරසාර සම්පත් භාවිතය සහ පාරිසරික සංරක්ෂණය සහතික වන පරිදි ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා අංශයේ සීඝ්‍ර වර්ධනයක් අපේක්ෂා කෙරේ.

2.4.2 ඵලදායිතාව නැංවීමේ මධ්‍යකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, කෘෂිකාර්මික අංශයේ ආයෝජන, වැඩි අස්වනු ප්‍රභේද හඳුන්වාදීම, ජලාධාර සංරක්ෂණය හා කළමනාකරණය, ඵලදායී ඉඩම් භාවිතය, නව තාක්ෂණ ක්‍රම හඳුන්වාදීම, කෘෂි නිෂ්පාදනයන්හි එකතු කළ අගය වැඩි කිරීම, භෝග විවිධාංගීකරණය, වෙළඳනාම ප්‍රවර්ධනය හා ප්‍රතිරූප නැංවීම කෙරෙහි අවධානය යොමු වනු ඇත. මෙහිලා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග, ධීවර, මහවැලි හා වැවිලි කර්මාන්ත පිළිබඳව වගකිවයුතු අමාත්‍යාංශ තම ප්‍රතිපත්තීන් හා වැඩ සටහන් තුළින් කෘෂිකාර්මික අංශයේ ඉහළ ඵලදායිතාව හා වර්ධනය යන මැදි කාලීන අරමුණ සාක්ෂාත් කර ගන්නා ආකාරය පැහැදිලිවම පෙන්වා දිය යුතුය.

2.4.3 ප්‍රාථමික/නොනිමි නිෂ්පාදනයන්හි සිට ඉහළ එකතුකළ වටිනාකමක් ඇති, දේශීය අමු ද්‍රව්‍ය මත පදනම් වූ නිෂ්පාදනයන්ට යොමුවීම සහ නිෂ්පාදනයේදී උසස් තාක්ෂණ භාවිතය සඳහා, කර්මාන්තයන් දිරි ගන්වනු ලැබේ. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සංවර්ධනය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.

2.4.4 කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයන් සඳහා වූ දේශීය වෙළඳපොළ සහතික කරන අතරම, ද්විපාර්ශික හා කලාප වෙළඳ ගිවිසුම් මගින් විදේශ වෙළඳ පොළ සඳහා අවශ්‍ය පහසුකම් ඇති කරනු ලැබේ. මෙම වෙළඳ ගිවිසුම් හා විශේෂයෙන්ම පොදු වරණ ක්‍රමය (GSP+) මගින් ඇති කර තිබෙන සහනයන් උපයෝගී කර

ගනිමින් අපනයන අවස්ථාවන් පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා පෞද්ගලික අංශය දිරිගැන්වීමට උපරිම ප්‍රයත්නයන් ගත යුතුය. සමස්ත අපනයන ආදායම, ඉදිරි වසර පහ තුළදී දෙගුණ කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ එක්ව වැඩසටහන් සකස් කළ යුතුය.

2.4.5 සංචාරක කර්මාන්තය, ඉහළ ක්‍රය ශක්තියක් ඇති සංචාරකයින් ඉලක්ක කර ගනිමින් පාරිසරික සංචාරක සංකල්පය මත පදනම් වනු ඇත. ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවකු බවට සංචාරක කර්මාන්තය පමුණුවන අතරම, ගිලිහී ගිය අවස්ථාවන් යළි ලබා ගැනීම සඳහා නව ප්‍රවේශයන් දිරි ගන්වනු ලැබේ. තවද ද.දේ.නි. යෙන් 2.5% ක් වූ සංචාරක කර්මාන්තයේ වර්තමාන දායකත්වය, ඉදිරි වසර තුන තුළදී 5% දක්වා වැඩි කෙරෙන විශේෂිත ව්‍යාපෘති යෝජනාවන් සඳහා අනුබල දෙනු ලැබේ.

2.4.6 තම අමාත්‍යාංශය යටතේ පවත්නා සමහර ව්‍යාපෘති තීරණාත්මක ඇගැයීමකට ලක්කිරීමට සහ වඩාත් ඵලදායී ක්‍රියාකාරකම් යෝජනා කිරීමට අමාත්‍යාංශ උනන්දු විය යුතුවේ.

වගුව IV

| අමාත්‍යාංශය | ප්‍රධාන ආරම්භනයන් |
|---|---|
| කෘෂිකර්ම | |
| කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග | අස්වනු හා පසු අස්වනු තාක්ෂණ ක්‍රම වැඩි දියුණු කිරීම, කුඩා ගොවීන් සංවර්ධනය කිරීම, භෝග විවිධාංගීකරණය, කාබනික නිෂ්පාදන වැඩි දියුණු කිරීම, විසිතුරු මල් වගාව ප්‍රවර්ධනය, කුරුඳු වගාව සංවර්ධනය, දේශීය කිරි නිෂ්පාදනය හා භාවිතය ඉහළ නැංවීම සහ වාරි පහසුකම් වැඩි දියුණු කිරීම |
| මහවැලි, ගංගාධාර සංවර්ධන සහ රජරට සංවර්ධන | උඩවලව වම් ඉවුර, B පද්ධතිය සහ C පද්ධතිය, සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම |
| වැවිලි කර්මාන්ත | වැවිලි කර්මාන්ත අංශයේ සහ සම්බන්ධිත කර්මාන්තවල නිෂ්පාදිතය ඉහළ නැංවීම සහ නිෂ්පාදන තත්වය ප්‍රවර්ධනය කිරීම |
| ධීවර හා ජලජ සම්පත් | නිෂ්පාදනය වර්ධනය සඳහා නව තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම, ධීවරයින් සඳහා වෙළඳපොල අවස්ථා ඇති කිරීම, ධීවරයින් සඳහා ගුවන් විදුලි පණිවුඩ හුවමාරු ජාලයක් නඩත්තු කිරීම. වෙරළ කලාප සංරක්ෂණය කිරීම සහ ධීවර වරායන් නැවත ගොඩනැංවීම |
| පරිසර | |
| පාරිසරික හා ස්වභාවික සම්පත් | ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම, වන වගාව වැඩි කිරීම, ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම හා ජල දූෂණය අවම කිරීමේ ව්‍යාපෘති |
| කර්මාන්ත | |
| කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන | කර්මාන්තපුර යටිතල පහසුකම්, ආයෝජන ප්‍රවර්ධන වැඩ සටහන් |
| උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය, දහස්දිරිය වැඩසටහන |
| මුදල් හා ක්‍රමසම්පාදන | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ණය යෝජනා ක්‍රම |
| සේවා | |
| සංචාරක<br><br>වෙළඳ,වාණිජ හා පාරිභෝගික කටයුතු | පාරිසරික සංචාරක කර්මාන්තය සහ සංස්කෘතිය හා සම්බන්ධ වූ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, ඉහළ ක්‍රය ශක්තියක් ඇති දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ශණය කර ගැනීම සඳහා යටිතල පහසුකම් දියුණු කිරීම<br>නිදහස් වෙළඳ ගිවිසුම් මගින් වෙළඳ අවස්ථාවන් පුළුල් කිරීම |
| කෘෂිකාර්මික, අලෙවි සංවර්ධන සහ සමුපකාර සංවර්ධන, හින්දු ආගමික කටයුතු සහ සහායක අධ්‍යාපන හා වෘත්තිය පුහුණු | සමුපකාර අංශය සංවර්ධනය කිරීම |

## 2.5 විද්‍යාව, තාක්ෂණය හා පර්යේෂණ සංවර්ධනය

2.5.1 සහෘද රටවල් සමඟ උරෙනුර ගැටී ගමන් කිරීම සඳහා, ලංකාවේ තාක්ෂණික හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, දැනට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.13 ක් ව පවතින පර්යේෂණ හා සංවර්ධන සඳහා වන ආයෝජන මට්ටම, අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක් දක්වා මැදි කාලීන අයවැය රාමුව තුල වැඩි කිරීමේ අවශ්‍යතාවය ප්‍රත්‍යක්ෂ කරුණකි.

වගුව V

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | කාර්ය |
|---|---|
| විද්‍යාව හා තාක්ෂණය | විද්‍යාත වැඩ සටහන |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | ඊ- ශ්‍රී ලංකා ව්‍යාපෘතිය |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | ආයුර්වේද පර්යේෂණ |
| සෞඛ්‍ය ආරක්ෂණය හා පෝෂණ හා ඌව වෙල්ලස්ස සංවර්ධනය | වෛද්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය |
| නාගරික සංවර්ධන හා ජල සම්පාදන | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය I |
| කෘෂිකාර්මික අලෙවි සංවර්ධන හා සමූපකාර සංවර්ධන | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය II |
| ධීවර හා ජලජ සම්පත් | ජලජ සම්පත් පර්යේෂණ ප්‍රවර්ධනය |
| උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන | ගුණාත්මක බව පවත්වා ගෙන යාම සඳහා ප්‍රමිතීන් හඳුන්වාදීම හා වර්ධනය, මැණික් පිළිබඳ අධ්‍යයනය සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම, මැණික් හා ස්වර්ණාභරණ සම්බන්ධයෙන් පර්යේෂණ ප්‍රවර්ධනය |
| වැවිලි කර්මාන්ත<br>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | තේ,පොල් හා රබර් සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය<br>ස්වභාවික විපත් පුරෝකථනයට හා තොරතුරු බෙදා හැරීමට නව තාක්ෂණය හඳුන්වාදීම. |

## 2.6 සමාජ ආරක්ෂණය

2.6.1 සමාජයේ වඩාත් පහසුවෙන් පීඩනයට ගොදුරු වන සහ අඩු වරප්‍රසාදලාභී ජන කොටස්වල සමාජ අවදානම අවම කිරීම මෙහිදී අවධානයට ලක් කළ යුතු එක් මූලික ක්ෂේත්‍රයකි. මෙම තත්වය යටතේ, රාජ්‍ය මුදල් යෙදවීමේදී පහත සඳහන් කරුණු අදාල රේඛීය අමාත්‍යාංශ විසින් සැලකිල්ලට ගත යුතුවේ.

- වඩාත් පහසුවෙන් පීඩනයට ගොදුරු වන ජන කණ්ඩායම් ඵලදායී ආර්ථික කටයුතුවල නිරතකරවීම සඳහා පහසුකම් සැලසීම.
- ආබාධිත සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රැකවරණ ලබා ගැනීමට ඇති ප්‍රවේශයන් තඟා සිටුවීම සහ එම සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ගංවතුර, භූ කම්පන සහ නියඟ වැනි විවිධ සමාජ අවදානම් තත්වයන් පිළිබඳව දැනුවත් කිරීම.

ඒ අනුව, ඵලදායි ආර්ථික ක්‍රියාකාරකම් සැලසීම, පවත්නා සමාජ ආරක්ෂණ පද්ධතිය තාර්කිකරණය සහ වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කිරීම, ප්‍රජා සහභාගිත්වය පුළුල් කිරීම, සහ ආපදා කළමනාකරණ හැකියාව ගොඩ නැංවීම යන අංශ සඳහා රාජ්‍ය වියදම් අත්‍යාවශයෙන්ම යොමු කළ යුතුය.

වගුව VI

| අමාත්‍යාංශ | ප්‍රධාන ව්‍යාපෘති |
|---|---|
| සමෘද්ධි සහ දිළිඳුකම පිටුදැකීම | සමෘද්ධි සහනාධාර |
| කාන්තා අභිවෘද්ධි සහ සමාජ සුභසාධන | සමාජ සේවා, පරිවාස සහ ළමාරක්ෂණ, කාන්තා සංවර්ධ න |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු | විශ්‍රාම වැටුප් |
| සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන | ලෝක ආහාර වැඩ සටහන - මාතෘ සහ දාරක පෝෂණ වැඩ සටහන, කාන්තාවන් හා දරුවන් අතර සූක්ෂම පෝෂණ ඌනතාවයන් පාලනය,ත්‍රිපෝෂ වැඩ සටහන, |
| සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසන්ධාන | ලෝක අහාර වැඩ සටහන , අභ්‍යන්තරව අවතැන්වූවන්ට සහාය වීම |

## 2.7 කලාව, සංස්කෘතිය සහ ආගම

සියළුම ආගම්වලට සම්බන්ධ වූ ආගමික අධ්‍යාපන වැඩ සටහන්, සංස්කෘතිමය දැනුවත් කිරීමේ සහ සංස්කෘතිය නංවාලීමේ වැඩ සටහන්ද, සංස්කෘතිමය වශයෙන් සහ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වූ පුරාවිද්‍යා ස්මාරක, සම්ප්‍රදායික කලා ශිල්ප, සංරක්ෂණය කිරීම සහ රැක ගැනීමේ වැඩ සටහන්වලටද මෙම අංශය යටතේ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුවේ.

වගුව VII

| අමාත්‍යාංශය | ප්‍රධාන ආරම්භනයන් |
|---|---|
| බුද්ධ ශාසන | දහම් පාසැල් කටයුතු නංවාලීම, ඓතිහාසික ආගමික ස්ථාන සංරක්ෂණය කිරීම, පෞරාණික බෞද්ධ ආගමික ස්ථාන පුනරුත්ථාපනය කිරීම සහ බෞද්ධ අගයන් නංවාලීම. |
| කෘෂිකර්ම අලෙවි සංවර්ධන සමුපකාර සංවර්ධන, හින්දු ආගමික කටයුතු, සහ සහායක අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු | හින්දු ආගමික ස්ථාන පුනරුත්ථාපනය කිරීම සහ හින්දු ආගමික කටයුතු නංවාලීම |
| සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ | ජාතික සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, ඒවා සංවර්ධනය සහ ඒවා පිළිබඳ නිසි ප්‍රචාරයක් ලබාදීම |
| ක්‍රිස්තියානි ආගමික සහ පාර්ලිමේන්තු කටයුතු | දහම් පාසැල් කටයුතු නංවාලීම සහ ඓතිහාසික වැදගත්කමකින් යුත් පල්ලි ප්‍රතිසංස්කරණය කිරීම. |
| මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු | මුස්ලිම් ආගමික කටයුතු නංවාලීම |
| නාගරික සංවර්ධන සහ ජල සම්පාදන | පූජා නගර සංවර්ධන වැඩ සටහන |

## 2.8 රාජ්‍ය පාලනය

2.8.1 මෙහිදී ප්‍රධාන අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන්නකු ලෙස රජයේ අනුග්‍රහාත්මක ක්‍රියාදාමය ශක්තිමත් කිරීම සහ රාජ්‍ය සේවාව වඩාත් කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් යුතුව, සහ වගවීමෙන් යුතුව සුහදශීලි ලෙස පවත්වාගෙන යාම කෙරෙහිය.

2.8.2 මැදිකාලීන වශයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබිය යුත්තේ රජයේ නීති සහ ක්‍රියාදාමයන් වඩාත් ලිහිල් කිරීම මගින් ගණුදෙනු පිරිවැය අවම කිරීමටත්, රාජ්‍ය සේවාවේ තරඟකාරීත්වය වැඩිදියුණු කිරීමටත්, දූෂණය, නාස්තිය, අකාර්යක්ෂමතාවය සහ අල්ලස පිටු දැකීමටත්ය. පරිපාලනයට අදාල තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයක් මාධ්‍යවලට සහ පුරවැසියනට ලබාදීම සඳහා විද්‍යුත් රාජ්‍ය පාලනය (E- Governance) ශක්තිමත් කිරීමට පියවර ගැනීමත් ඉතා අවශ්‍යයය. 2006 වසරේ අයවැය සම්පාදනයේදී ඉහළම ප්‍රමුඛත්වය ලබාදිය යුත්තේ රාජ්‍ය කළමනාකාරීත්වයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශක්තිමත් කිරීම සහ මහජනතාවගේ අභිලාෂයන්ට අනුකූලතා දක්වන වඩාත් හොඳ දිස්ත්‍රික් පරිපාලන පද්ධතියක් ගොඩනැංවීම කෙරෙහිය.

දිස්ත්‍රික් මට්ටමේ සේවා සැපයීමේ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙනුවෙන් සකස් වූ කුසලතා සංවර්ධන වැඩසටහන් පැහැදිලිව හඳුනාගැනීම ද මෙහිදී අවශ්‍යයෙන්ම කළ යුතුය.

වගුව VIII

| අමාත්‍යාංශය | ප්‍රධාන ක්ෂෙත්‍ර |
|---|---|
| විශේෂ වියදම් ඒකක | ව්‍යවස්ථාවෙන් පැවරී ඇති විධායක සහ නෛතික කාර්යයන් ක්‍රියාත්මක කිරීම |
| විදේශ කටයුතු | විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා විදේශ සබඳතා කටයුතු පවත්වා ගැනීම |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා | සාමය ගොඩනැගීම සහ ජාතික සමගිය තහවුරු කිරීම |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | රාජ්‍ය සේවා සැපයීමේ යාන්ත්‍රණයේ ගුණාත්මක භාවය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම |
| තොරතුරු හා මාධ්‍ය | සාධාරණ හා පහසු ප්‍රවේශයකින් යුත් තොරතුරු හා මාධ්‍ය ජාලයක් ඇති කිරීම |
| ක්‍රිස්තියානි සහ පාර්ලිමේන්තු කටයුතු | මහජන නියෝජිතයින්ගේ නිල කටයුතු සඳහා පහසුකම් සැපයීම |

## 2.9 මහජන සාමය හා ආරක්ෂාව

2.9.1 නීතිය හා සාමය පවත්වාගෙන යාම, පුරවැසියින්ගේ නීතිමය අයිතිවාසිකම් සුරැකීම හා ජාතික ආරක්ෂාව සැපයීම තුලින් සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම, තිරසාර සංවර්ධනයක් සඳහා අත්‍යාවශ්‍ය වේ.

2.9.2 ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් ලෙස රටේ සංවර්ධන ආයෝජනයන් වැඩි කිරීම උදෙසා ආරක්ෂක වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.5 % දක්වා ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමට රජය බැඳී සිටී. මෙහිදී අපරාධ මර්ධනය, සාමාන්‍ය ජනයා නීති පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීම හා යුක්තිදාමයට ප්‍රවේශ වීමේ අවකාශ පුළුල් කිරීම හා ත්‍රස්තවාදය මර්ධනය කිරීම, කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. අභියාචනාධිකරණ විමධ්‍යගත කිරීම, සමථ මණ්ඩල ප්‍රවර්ධනය, නීති ආධාර කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පුළුල් කිරීම, ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති දියුණු කිරීම, බන්ධනාගාර වල තදබදය අඩු කිරීම, නීති බලාත්මක කිරීම පහසු කරවීම හා වඩා කාර්යක්ෂම සේවයක් සපයනු පිණිස පුහුණු වැඩසටහන් පැවැත්වීමට හා අවශ්‍ය උපකරණ සැපයීමට පියවර ගත යුතුව ඇත. ව්‍යාපාර සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා, පිරිවැය අවම වූ, ව්‍යාපාර හිතකාමී නීති හා නියාමන ක්‍රමවේදයක් ඇති කිරීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කල යුතුය.

වගුව IX

| අමාත්‍යාංශය | ප්‍රධාන ආරම්භනයන් |
|---|---|
| අධිකරණ හා අධිකරණ ප්‍රතිසංස්කරණ | යුක්තිදාමය සඳහා වන ප්‍රවේශය පුළුල් කිරීම, අභියාචනාධිකරණ විමධ්‍යගත කිරීම, සමථ මණ්ඩල ශක්තිමත් කිරීම හා වෘත්තියමය සංවර්ධනය ඇතුලු ධාරිතාව මඟින් හැකියා වර්ධනය. |
| මහජන ආරක්ෂාව, නීතිය හා සාමය | අපරාධ වර්ධන වේගය අඩු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම |
| ආරක්ෂක | ජාතික ආරක්ෂාව සැපයීම |

## 2.10 සංවර්ධන ප්‍රතිපත්ති මුලාරම්භයන්

2.10.1 රටෙහි ආර්ථික සංවර්ධනයෙහිලා සමාන වැදගත් කමක් ඇති රාජ්‍ය අංශයෙහි සහ පෞද්ගලික අංශයෙහි කාර්යභාරය නංවාලීම සඳහා රාජ්‍ය අංශයේ හැකියාව වර්ධනය කිරීම පිණිස රජය විසින් පහත සඳහන් මූලාරම්භයන් ගෙන ඇත.

- ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ජාතික සභාව (NCED) - ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී හා රේඛීය අමාත්‍යාංශ බලගැන්වීමේදී, රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සම්බන්ධීකරණය කිරීම.
- උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) – උපාය මාර්ගික රාජ්‍ය ව්‍යාපාරවල කාර්යභාරය ශක්තිමත් කිරීම.
- පරිපාලනය පිළිබඳ වූ ජාතික මණ්ඩලය (NCA) - රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රතිපත්ති සැකැසීම හා අනුමත සේවක කළමනාකරණ ගැටළු විසඳීම.
- ජාතික සැපයුම් ආයතනය (NPA) – රාජ්‍ය අංශයේ ජාතික මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රමවත් කිරීම හා කාර්යක්ෂම මිළදී ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුව (ARC) - රාජ්‍ය සේවය ක්‍රමවත් කිරීම
- ආදායම් පරිපාලනය නවීකරණය කිරීම - බදු පරිපාලනය වැඩි දියුණු කිරීම

වියදම් ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී සියලුම අමාත්‍යාංශ විසින් ඉහත සෑම ආයතනයකම කාර්ය භාර්යය හඳුනා ගත යුතුවේ.

2.10.2 සිවිල් සමාජයේ හා පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන් (ඉල්ලීම්) හා රාජ්‍ය අංශයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් සෑම අමාත්‍යාංශයක් විසින්ම, එම අමාත්‍යාංශවල රාජ්‍ය අංශයේ කාර්යයභාරය මැනවින් තක්සේරු කල යුතුවේ. ඒ සඳහා, අවම වියදම් ක්‍රමය භාවිතයට ගනිමින් සෑම අමාත්‍යාංශයක්ම, රාජ්‍ය අංශය තවදුරටත් කාර්යක්ෂම හා මහජන හිතවාදී කිරීම සඳහා නව ප්‍රතිසංස්කරණ මූලාරම්භයන් ඉදිරිපත් කළ යුතුවේ.

## 2.11 මැදිකාලීන වියදම් රාමුව (2006-2008)

අයවැය මැදිකාලීන වියදම් රාමුවක් තුල ඉදිරිපත් කෙරේ. එමනිසා, අමුණා ඇති ඇමුණුම් III භාවිතා කරමින් 2007 හා 2008 වර්ෂ සඳහාද ප්‍රාග්ධන මෙන්ම සහ පුනරාවර්තන වියදම් පිළිබඳව විස්තරාථ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන මෙන් වැය දරණ ආයතන වලින් ඉල්ලා සිටී.

### 2.11.1 මැදිකාලීන පුරෝකථනයන්

මැදිකාලීන වියදම පුරෝකථනය කිරීමේදී පහත සඳහන් නිර්නායකයන් භාවිතා කළ යුතුවේ.

(I) උද්ධමනය: උද්ධමනය සඳහා වියදම් ගැලපීම් නොකල යුතුය. 2007- 2008 වර්ෂ සඳහා උද්ධමන ගැලපීම් මහා භාණ්ඩාගාරය විසින් කරනු ඇත.

(II) ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාවේ වෙනස්කම්: විශ්‍රාම වැටුප්, පාසැල් නිල ඇඳුම් වැනි වැඩසටහන් සඳහා වියදම් පුරෝකථන සැකසීමේදී ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව සම්බන්ධයෙන් වූ අපේක්ෂිත වෙනස්කම් සැලකිල්ලට ගත යුතුවේ. ප්‍රතිපාදන අවශ්‍යතාවයන් සාධාරණීකරණය කිරීම සඳහා එවැනි සියලුම ගැලපීම් ප්‍රතිලාභීන්ගේ නියමිත සංඛ්‍යාවද ඇතුලත්ව ඉදිරිපත් කළ යුතුවේ.

(III) වැටුප් සඳහා වූ ප්‍රතිපාදනවලට අදාල ගැලපීම්: භාණ්ඩාගාරය විසින් වැටුප් වැඩිවීම්වලට නියමිත අවශ්‍යතාවය සඳහා යම්කිසි මුදලක් වෙන් කර තබන බැවින්, ඉදිරි වසරවල පුද්ගල පඩිනඩිවලට පුරෝකථන සකස් කිරීමේදී අනාගතයේදී අපේක්ෂිත වැටුප් ගැලපීම් සඳහා (2007-2008 වර්ෂ වෙනුවෙන්) ප්‍රතිපදාන ඇතුලත් නොකළ යුතුය.

### 2.11.2 මැදිකාලීන කාර්ය සාධන දර්ශක

ඉහත සඳහන් 2.0 හි සඳහන් කොට ඇති පරිදි මධ්‍යකාලීන වශයෙන් වූ ප්‍රධාන කාර්යයන් සමඟ දිගුකාලීන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අනුව අමාත්‍යාංශයන්හි මෙහෙවර හා අරමුණ නිර්ණය කරනු ඇත. ව්‍යාපෘති යනු ආයතනයක මෙහෙවර ඉටු කර ගනු ලබන මාධ්‍යයකි. මෙම ව්‍යාපෘතීන්ගේ අරමුණු පැහැදිලි මෙන්ම මැනිය හැකි විය යුතුවේ. කාර්යසාධන දර්ශකයන්, එක් එක් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිඹිඹු කෙරෙන ආකාරයේ නිශ්චිත දර්ශක විය යුතුවේ. එබැවින්, ඇමුණුම III හි සපයා ඇති ආදර්ශ ආකෘතිය භාවිතා කරමින් ප්‍රධාන ක්‍රියාකරකම් සඳහා යෙදවුම්,නිමැවුම්, කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල නිර්ණය කෙරෙන කාර්ය සාධන දර්ශක වැය දරණ ආයතන විසින් නිශ්චිතව දැක්විය යුතුයැයි අපේක්ෂා කෙරේ.

### 2.11.3 ප්‍රාදේශීය පදනම මත සම්පත් බෙදාහැරීම

දැනට තිබෙන සම්පත් තුලින් රටතුල ප්‍රාදේශීය වශයෙන් සමබර වූ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මැදිකාලීන අරමුණවේ. ඒ සඳහා දිස්ත්‍රික් හා උප දිස්ත්‍රික් මට්ටමින් සම්පත් බෙදා හැරීම, අසමානතාවයන් අවම කිරීම සඳහා ප්‍රමාණවත් වේද යන්න පිරික්සිය යුතුයැයි තිරණය කර ඇත. ඒ අනුව ඇමුණුම IV හි දැක්වෙන පරිදි සියළු ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අදාල තොරතුරු සපයන ලෙසට සියළුම වැය දරණ ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

### 2.12 අංශයීය වියදම් සීමා

ඉහත දැක්වූ අංශයීය ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවයන් කරා ළඟාවීම සහතිකකරනුවස්, සම්පත් වෙන් කිර්ම පහසු කරවීම උදෙසා V වන ඇමුණුමෙහි පරිදි, අමාත්‍යාංශ සඳහා අපේක්ෂිත වියදම් සීමා දක්වා ඇත. මෙම අපේක්ෂිත වියදම් සීමා තුල එක් එක් අමාත්‍යාංශයට අයත්වන දෙපාර්තමේන්තු සඳහා වන ප්‍රතිපාදනද ඇතුලත් වේ. එසේම, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා අයවැය ප්‍රතිපාදනද අදාල අමාත්‍යාංශවල "වෙනත් පුනරාවර්තන" සහ "වෙනත් ප්‍රාග්ධන" වියදම් යටතේ ඇතුලත් කර ඇත. සුනාමි සම්බන්ධ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදනද අදාල අමාත්‍යාංශ යටතේ දක්වා ඇත. ඊට අමතරව මෙම චක්‍රලේඛයේ 2 වන කොටසේ විස්තර කල අංශයීය වර්ගීකරණය යටතේ දැක්වෙන අංශ සඳහා ද වියදම් සීමා ඇමුනුම් අංක VI හි වෙනම උපලේඛණයක් ලෙස දක්වා ඇත.

### 2.12.1 පුනරාවර්තන වියදම් සීමා

වියදම් සීමා තිරණය කිරීමේදි අනුමත සේවක සංඛ්‍යාවෙන් 2005. 06. 30 වන දිනට සැබැවින්ම සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පුද්ගල පඩිනඩි සඳහා අපේක්ෂිත ප්‍රතිපාදන ගණනය කර ඇත. එසේම අමාත්‍යාංශ යටතේ වන ආයතන විසින් උපාධිධාරින් ස්ථිර තනතුරු සඳහා බඳවාගැනීම පිණිස අනුමත කරගෙන ඇති තනතුරු සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද පුද්ගල පඩිනඩි වල ඇතුලත් කර තිබේ. 2005 වර්ෂයේ අයවැය මඟින් ප්‍රකාශිත 2006 වසරේ ජනවාරි සිට ක්‍රියාත්මකවීමට නියමිත, වැටුප් වැඩිවීමේ ඊළඟ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදනද අපේක්ෂිත වියදම් සීමා තුල ඇතුලත් කර ඇත. අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි හා මිළ වෙනස්වීම් ද සැලකිල්ලට ගනිමින්, අනෙකුත් වියදම් සඳහා ප්‍රතිපාදන ගණනය කර තිබේ. එසේම, ඒ ඒ ආයතන යටතේ හඳුනාගත හැකි සමහර බැඳීම්/වගකීම් නිරවුල් කිරීම සඳහා වන ප්‍රතිපාදන ද අපේක්ෂිත වියදම් සීමාව තුල ඇතුලත් කර තිබේ.

### 2.12.2 ප්‍රාග්ධන වියදම් සීමා

ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා හා දැනටමත් අනුමැතිය ලැබී ඇති ව්‍යාපෘති සඳහා 2006 වසර තුලදි ඇති මූල්‍යමය බැඳීම් ප්‍රාග්ධන වියදම් සීමාවේ පදනම වශයෙන් හඳුනා ගෙන ඇත. එය පහත සඳහන් ආකාරයට වෙන් වෙන්ව දක්වා ඇත.

(i) විදේශ අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල පිරිවැය සහ එවැනි ව්‍යාපෘතිවලට සම්බන්ධ දේශීය අරමුදල් අවශ්‍යතාවයන් සහ

(ii) මුළුමනින්ම දේශීය අරමුදල් යොදා ගැනෙන අනෙකුත් ප්‍රාග්ධන වියදම්

කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූල නොවන ව්‍යාපෘති සඳහා වන අයවැය ප්‍රතිපාදන අඩුකරමින්, අපේක්ෂිත වියදම් සීමාව තුල, ඉහල ප්‍රමුඛතාවයක් හිමි විය යුතු ව්‍යාපෘතින් සඳහා සම්පත් වෙන් කිරීමට අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවලට නිදහස ඇ ත.

## 3 වන කොටස - අයවැය සැකසීමේ මාර්ගෝපදේශ

### 3.1 ඇස්තමේන්තු සකස් කිරීම

මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති මාර්ගෝපදේශ අනුව, චක්‍රලේඛයට අමුණා ඇති අදාල ආකෘති භාවිතා කරමින්, අපේක්ෂිත වියදම් සීමා තුළ, 2006 වසර සඳහා ඇස්තමේන්තු (අමාත්‍යාංශය යටතට වැටෙන සියලුම ආයතන ඇතුළුව) සකස් කරන ලෙස සියලුම අමාත්‍යාංශවලින් ඉල්ලා සිටිනු ලැබේ. අමාත්‍යාංශය සඳහා වෙන්කර ඇති අපේක්ෂිත වියදම් සීමාව තුළ, තම අමාත්‍යාංශය යටතේ ඇති සියලුම වැය දරණ ආයතන සඳහා ප්‍රතිපාදන වෙන් කර දීම අමාත්‍යාංශ ලේකම්වරයාට තම අභිමතය පරිදි ඉටු කළ හැක. එසේ වුවද, යම් ඉහළ ප්‍රමුඛතාවක් ඇති කාර්යයකට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන්කොට නොමැති බව මහ භාණ්ඩාගාරය විසින් නිරීක්ෂණය කරනු ලැබුවහොත්, අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ අපේක්ෂිත වියදම් සීමාව ඇතුළත එකී කාර්යය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම පිණිස අදාල ඇස්තමේන්තු නැවත සකස් කරනු ලැබේ.

#### 3.1.1 පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු

I. පුද්ගල පඩි නඩි හා වේතන හැර, පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී, 2006 වසරේ මෙහෙයුම් කාර්යයන් සඳහා සම්පත් වෙන් කිරීමට ප්‍රථම, 2005 වසරේ ප්‍රතිපාදනවලින් ගෙවීමට නොහැකි නිසා 2006 වසරේදී ගෙවීමට සිදුවන යම් හිඟ ගෙවීම් හා මූල්‍යමය බැඳීම් ඇතොත් ඒවා නිශ්චය කර ගන්නා ලෙස වියදම් වැය දරණ ලබන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. හිඟ ගෙවීම් හා මූල්‍යමය බැඳීම් සඳහා අවශ්‍යවන ප්‍රතිපාදන නිවැරදිව තක්සේරු කර ගැනීමෙන් අනතුරුව අනෙකුත් පුනරාවර්තන වැය පිළිබඳව තම අභිමතය අනුව තීරණ ගැනීමට වියදම් සිදු කරනු ලබන ආයතනවලට නිදහස ඇත.යම් යම් මූල්‍යමය වගකීම් සඳහා අපේක්ෂිත වියදම් සීමාව තුල ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි නම් එවැනි වගකීම් අපේක්ෂිත වියදම් සීමාවට පිටතින් වෙනම දැක් විය යුතු අතර, එසේ වියදම් සීමාව තුල ඇතුළත් කිරීමට නොහැකිවීමට හේතු විස්තර කෙරෙන සටහනක්ද ඒ සමඟ තිබිය යුතුය.

II. කිසිදු වැය දරණ ආයතනයක්, මාස දෙක ඉක්මවා යන හිඟ වියදම් සඳහා සැලසුම් නොකළ යුතු අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව පරීක්ෂාවකින් තොරව එවැනි ආකාරයේ කිසිඳු මූල්‍යමය බැඳීමක් ඇතිකර නොගත යුතුය.

III. අංක 18 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2003.01.01 දිනෙන් පසුව සිදු කරන ලද බඳවා ගැනීම් සඳහා වැය විෂය සංකේතාංක 1004- “ දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ‘’ යටතේ ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

IV. අතිකාල සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සාධාරණී කරණය කළ හැකි විය යුතුය. සාමාන්‍යයෙන් ඕනෑම වැය දරනු ලබන ආයතනයක අතිකාල සඳහා වූ මුළු ප්‍රතිපාදනය, වැටුප් හා වේතනවලින් 5% කට සීමා කළ යුතු යැයි යෝජනා කෙරේ.

V. උපයෝගිතා සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

VI. රජයේ සේවකයින් සඳහා වූ නිවාස ණය යෝජනා ක්‍රමයේ පොලී ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වැය විෂයාංක 1006 යටතේ දැක්විය යුතුය.

## 3.1.2 ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු

ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු භූමිකා දෙකකින් යුතුව සකස් කළ යුතුවේ.

(අ) අවම වියදම් භූමිකාව :

වැය දරන ආයතනයන්හි පවතින (සාමාන්‍ය) ආයතනික හැකියාව හා ධාරිතාවය ප්‍රයෝජනය ගනිමින් සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් පිළිබඳව අයවැය ඇස්තමේන්තු අපේක්ෂිත වියදම් සීමා ඇතුළත සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වියදම් ඇස්තමේන්තු නිශ්චය කර ගැනීමේදී පහත දැක්වෙන නිර්නායක යොදා ගත යුතුය.

(I) අතීත බැඳීම් නිරවුල් කිරීම. ඉකුත් වර්ෂයේ නොපියවන ලද වගකීම් ඇතොත් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කල යුතුය.

(II) ප්‍රාග්ධන වත්කම් නඩත්තුව හා වැඩිදියුණු කිරීම.

(III) ක්‍රියාත්මකවෙමින් පවතින ව්‍යාපෘති තාර්කිකරණය කිරීම. වසර ගණනාවක සිට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව යථාර්ථවාදීව සලකා බලන ලෙස සියලුම වැය දරණ ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. එවැනි ව්‍යාපෘති, වර්තමාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සමඟ නොගැළපේ නම් සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම උදෙසා නව ව්‍යාපෘති හඳුන්වා දිය හැක.

(IV) අදාල වියදම් සීමා ඇතුළත සලකා බලන ලද නව ව්‍යාපෘති

(V) දේශීය අරමුදල් යොදාගනිමින් අලුත් වාහන (ජීප්, කැබ්රථ, කාර්) මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතුය.

(ආ) උපරිම වියදම් භූමිකාව

උපරිම ආයතනික හැකියාව හා ධාරිතාවය උපයෝගී කර ගනිමින්, මෙම චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපත්තිමය නියමයන්ට අනුකූලව සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් පිළිබඳව ද ඇස්තමේන්තු සකස් කරන ලෙසට වැය දරන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. මේ සඳහා එම වැය දරණ ආයතන පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

(I) නව ව්‍යාපෘති සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් කිරීම: පවතින සම්පත් ප්‍රමාණය, අන්තර් අංශයීය ප්‍රමුඛතා හා ජනතාවට සැලසෙන අපේක්ෂිත ප්‍රතිලාභ, සැලකිල්ලට ගනිමින් අතිරේක ප්‍රතිපාදන සලසාදීමට මහා භාණ්ඩාගාරය විසින් ප්‍රයත්න දරනු ඇත.

(II) ඇමුණුම VII හි දක්වා ඇති ආකෘතිය භාවිත කරමින් සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

## 3.2 පරිපූරක ප්‍රතිපාදන - 2006

අතිරේක අසවැය ප්‍රතිපාදන සඳහා සහ මු.රෙ. 66 යටතේ මාරු කිරීම් සඳහා ඉල්ලුම් කිරීමේදී අදාළ ලේකම් විසින් එම අවශ්‍යතා හදිසි හා අනපේක්ෂිත ඒවා බවට දැඩි ලෙස තහවුරු කර නොමැති නම් එවැනි ඉල්ලීම් පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් සලකා බලනු නොලැබේ. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟත්වය නොමැතිව අතිරේක ප්‍රතිපාදන සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් නොකරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එමනිසා, 2006 වසරේ කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු යථාර්ථවාදී ආකාරයෙන් සකස් කිරීම ලේකම්වරුන්ගේ වගකීම වනු ඇත.

## 3.3 වෙනත් තොරතුරු

3.3.1 අනුමත සේවක සංඛ්‍යාව හා වාහන පිළිබඳ තොරතුරු.

VIII ඇමුණුමෙහි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින්, අනුමත සේවක සංඛ්‍යාව හා වාහන පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන ලෙස සියලුම වැය දරණ ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

## 3.4 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 3.4.1 වැඩසටහන් සහ වැය විෂයයන්

ජාත්‍යන්තර වර්ගීකරණයට ගැලපෙන පරිදි සකස් කරන ලද වැය විෂයයන් හා සම්මත වැඩසටහන් පිළිවෙලින් IX හා X ඇමුණුම්වල දක්වා ඇත. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේදී නිවැරදි වැඩසටහන් හා වැය විෂයයන් තෝරා ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ. සුනාමි හා සම්බන්ධ වියදම් වෙන්ව හඳුනා ගැනීම පිණිස, සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරන අමාත්‍යාංශ මගින්, සුදුසු වැඩසටහනක් යටතේ "50 - සුනාමි සහන හා ප්‍රතිසංස්කරණ " මැයෙන් වෙනම ව්‍යාපෘතියක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ.

### 3.4.2 උප ව්‍යාපෘති

නිශ්චිත වශයෙන් ම වෙනම කාර්යයක් ලෙස හඳුනාගත හැකි ඇතැම් වැදගත් ප්‍රාග්ධන වියදම් වෙනම හඳුනාගත නොහැකි සේ කාණ්ඩගත කර ඇති අවස්ථා දක්නට ලැබේ. එමනිසා, එවැනි කාර්යයන්, විශේෂයෙන්ම ප්‍රතිපත්තිමය වැදගත්කමක් ඇති කාර්යයන්, හඳුනා ගෙන ඒවා උප ව්‍යාපෘති ලෙස වෙනම පෙන්වීමට වැය දරණ ආයතන උත්සාහ කළ යුතුය. මෙමගින් වියදම් කළමනාකරණය හා අධීක්ෂණය වඩා හොඳින් සිදු කිරීම පහසු කරවනු ඇත.

### 3.4.3 ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනවලට අදාළ ඇස්තමේන්තු

ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන ද ඇමුණුම XI පරිදි අදාළ වැය විෂයයන් යටතේ තම ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු අතර, වියදම් ඇස්තමේන්තු මුදල් පදනම මත( Cash Basis) සකස් කළ යුතුවේ.

### 3.5 කෙටුම්පත් ඇස්තමේන්තු අයවැය දෙපාර්තමේතුව වෙත ලබාදීම

ඇස්තමේන්තු සකස් කිරීම කඩිනම් කිරීම පිණිස මෙම චක්‍රලේඛයේ 4 වන කොටසෙහි "ඇමුණුම්" ලෙස දක්වා ඇති ආකෘති, www.nbd.gov.lk වෙබ් අඩවියෙහි Microsoft Excel Worksheets ලෙස "ජාතික අයවැය චක්‍රලේඛයේ ඇමුණුම්" (Annexures of National Budget Circular) යනුවෙන් සපයා ඇත. මෙම ඇමුණුම් Excel Worksheet ලෙස බාගත (download) කිරීමට හෝ මුද්‍රිත පිටපත් ලෙස ලබා ගැනීමට පුළුවන. මෙම ඇමුණුම් මෘදු පිටපත් ලෙස (ව්‍යුහාත්මක වෙනස්කම් සිදු නොකර) සම්පූර්ණ කර 3 ½ සංයුක්ත තැටි (3 ½ Floppy) මඟින් එවිය යුතුවේ. ඒ සමඟම, නිසි ලෙස අත්සන තබන ලද ලිඛිත පිටපත් ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

## 4 වන කොටස - ඇමුණුම්

මෙම චක්‍රලේඛයෙන් සපයන ලද උපදෙස් අනුගමනය කරමින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පහත දැක්වෙන ආකෘති භාවිතා කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

| ඇමුණුම | විස්තරය |
|---|---|
| ඇමුණුම I | සහස්‍ර සංවර්ධන ඉලක්ක(MDG) |
| ඇමුණුම II | පශ්චාත් සුනාමි මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව 2005 – 2008 |
| ඇමුණුම III | මැදිකාලීන ව්‍යාපෘති විස්තරය 2006-2008 |
| ඇමුණුම IV | දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පදනම මත සම්පත්(ප්‍රාග්ධන) බෙදා හැරීම- 2006 |
| ඇමුණුම V | 2006 වසර සඳහා අමාත්‍යාංශ වල අපේක්ෂිත වියදම් සීමා |
| ඇමුණුම VI | 2006 වසර සඳහා අංශයීය වියදම් සීමා |
| ඇමුණුම VII | උපරිම වියදම් භූමිකාව යටතේ 2006 වසර සඳහා හඳුනාගත් යෝජිත නව ව්‍යාපෘති (අපේක්ෂිත වියදම් සීමවට පිටතින්) |
| ඇමුණුම VIII | අනුමත සේවක සංඛ්‍යාව හා වාහන පිළිබඳ තොරතුරු - 2006 |
| ඇමුණුම IX | 2006 වසර සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය - අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා |
| ඇමුණුම X | සම්මත වියදම් වැඩසටහන් |
| ඇමුණුම XI | 2006 වසර සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ආකෘතිය - ආයතන හා ව්‍යවස්ථාපිත මංඩල සඳහා |

### 4.1 පැහැදිලි කර ගැනීම්

මෙම චක්‍රලේඛයේ සඳහන් කරනු පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, ඔබගේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ව්‍යාවස්ථාපිත මණ්ඩලය පිළිබඳව කටයුතු කරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ඒ පිළිබඳ විමසිය හැක.

## 4.2 ඇස්තමේන්තු කෙටුම්පත් භාරදීම සඳහා අවසන් දිනය

ඇස්තමේන්තු කෙටුම්පත් 2005 අගෝස්තු 02 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

## 4.3 අපේක්ෂිත අයවැය දින දර්ශනය

| ඉලක්ක කාර්යයන් | අවසන් කළ යුතු දිනය / කාල සීමාව |
|---|---|
| 1. මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව සකස් කිරීම හා අයවැය චක්‍රලේඛය සඳහා ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම | 2005.07.12 |
| 2. අයවැය යෝජනා කැඳවමින් අයවැය චක්‍රලේඛය නිකුත් කිරීම | 2005.07.15 |
| 3. 2006 අයවැය හා ප්‍රමුඛතා පිළිබඳ සංක්ෂිප්ත සටහන අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම | 2005.07.25 |
| 4. රේඛීය අමාත්‍යාංශ විසින් අයවැය ප්‍රතිපාදනවලට අදාළ ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | 2005.08.02 |
| 5. රේඛීය අමාත්‍යාංශ සමඟ අයවැය ප්‍රතිපාදනවලට අදාළ ඉල්ලීම් පිළිබඳව සමාලෝචනය (ගරු අමාත්‍යවරුන් හා ලේකම්වරුන් සමඟ රැස්වීම් පැවැත්වීම) | 2005.08.03 සිට 2005.08.18 දක්වා |
| 6. විසර්ජන පනත් කෙටුම්පත, කෙටුම්පත් කර අවසන් කිරීම (වැඩසටහන් අනුව වියදම් සාරාංශය) | 2005.08.22 |
| 7. විසර්ජන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම | 2005.08.31 |
| 8. විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම) | 2005.10.06 |
| 9. අයවැය කථාව (විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම) | 2005.11.10 |
| 10. වියදම් දැරීමට බලය ලබාදීම (ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් කිරීම) | 2005.12.21 |
| 11. භාණ්ඩාගාරය විසින් 2006 වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිකුත් කිරීම | 2005.12.23 |

අත්/කලේ. පී.බී.ජයසුන්දර
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ
හා මහ භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:-

1. විගණකාධිපති.
2. සභාපතිවරුන්/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල
3. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්